# කුණ්ඩසාල කෘෂිකාර්මික ගොවිපළ ආශ්‍රිත බ්‍රිතාන්‍ය පාලන සමයට අයත් උරුමයන් පිළිබඳ විමර්ශනයක්

**ඩබ්.ජී.එස්.එන්.කේ. ජයවික්‍රම[1]**

ප්‍රමුඛ පද: බ්‍රිතාන්‍ය පාලන සමය, ගොඩනැගිලි, වාස්තු විද්‍යාව, ඉංජිනේරු තාක්ෂණය, වර්තමානය තත්ත්වය

**හැඳින්වීම**

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ කුණ්ඩසාල ප්‍රදේශයේ පිහිටි කෘෂිකාර්මික දෙපාර්තමේන්තුවට අයත් රජයේ ගොවිපළ භූමියේ ඉදිකර ඇති බ්‍රිතාන්‍ය පාලන සමයට අයත් ගොඩනැගිලි, එහි අතීත ප්‍රතිරූපය, වාස්තු විද්‍යාව, ඉංජිනේරු තාක්ෂණය, යන්ත්‍ර සූත්‍ර හා වර්තමාන තත්ත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් මෙහිදී සිදු කර තිබේ.

**ක්‍රමවේදය**

මේ සඳහා කුණ්ඩසාල කෘෂිකාර්මික ගොවිපළ ආශ්‍රිත ක්ෂේත්‍ර අධ්‍යයනයක් මගින් බීජ ගොවිපළ කළමනාකරු එන්.එස්. ගොඩගෙ මහත්මිය ලබා දුන් තොරතුරු සහ ප්‍රදේශවාසීන් ලබා දුන් තොරතුරු රැස්කර යථෝක්ත පර්යේෂණය සිදු කරන ලදී.

**ප්‍රතිඵල හා සාකච්ඡා**

මේ වන විට වර්තමානයේ අක්කර 140 ක පැතිර තිබෙන කුණ්ඩසාල කෘෂිකාර්මික ගොවිපළ බ්‍රිතාන්‍ය පාලන සමයේදී කොකෝවා, ගම්මිරිස්, කෝපි යන බීජ වෙලා අපනයනය කරන ලද අතර දැනට බ්‍රිතාන්‍ය පාලන සමයට අයත් ගොඩනැගිලි තුනක් ඉතිරිව ඇත. අතීතයේ මෙම ගොඩනැගිලි පැරණි බීජ වන කොකෝවා, ගම්මිරිස්, කෝපි යන බීජ වේලා ගන්නා මධ්‍යස්ථානයකි. මෙම ගොඩනැගිලි මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ කුණ්ඩසාල ප්‍රදේශයේ පිහිටි කෘෂිකාර්මික දෙපාර්තමේන්තුවට අයත් රජයේ ගොවිපළ භූමියේ ඉදිකර ඇත. මේ පිළිබඳ නිශ්චිත කාල සීමාවක් ලබා ගත නොහැකි අතර මෙහි ආසන්නයේ ඇති දෙමළ පාසල 1914 වර්ෂයේ දී ඉදිකර ඇත. බ්‍රිතාන්‍ය පාලන සමයේ මෙම මධ්‍යස්ථානයේ සේවය කිරීමට ඉන්දියාවෙන් ගෙන් වූ දෙමළ වතු කම්කරුවන් මෙම ගොඩනැගිල්ල අවට පදිංචි කර ඇත. වර්තමානයේ ද මෙම ප්‍රදේශයේ මෙම ගොවිපල අවට දෙමළ වැසියන් ජීවත් වේ. ඉන්දියාවෙන් ගෙන් වූ මෙම වතු කරුණුකරුවන්ගේ දරුවන්ට අධ්‍යාපනය ලබාදීම සඳහා මෙම පාසල ඉදිකර ඇති

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරන අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය
sankila2001@gmail.com

බව ප්‍රදේශවාසීන් පවසනු ලැබේ. ඒ අනුව මෙහි ඇති ගොඩනැගිලි 1815 න් පසු ඉදිකර ඇත. මෙම ගොඩනැගිලි පුළුස්සන ලද ගඩොල් භාවිතා කර ඉදිකර ඇත. මෙම ගොඩනැගිලි ඉන්දියාවෙන් ගෙන්වූ දෙමළ වතු කම්කරුවන්ගේ ශ්‍රමයෙන් ඉදිකර ඇත. වාස්තු විද්‍යාත්මක ලක්ෂණ ලෙස ආරුක්කු සහිතව ජනේල, දොරට ඉහළින් සාදා ඇති රවුම් හැඩැති සුළං කවුළු, ලී වලින් සාදන ලද පඩිපෙළවල් සහ සොල්දොර දැකගත හැකිය. මෙහි ඇති ආරුක්කු සහිත ඉදිකර ඇති ජනේල සහ දොරවල් ගොඩනැගිලි තු මහල්වල දැකගත හැකිය. ජනේල සහ දොරවල් සඳහා ලී භාවිතා කර ඇත. මෙහි ආරුක්කු හැඩය ගැනීම සඳහා පුළුස්සන ලද ගඩොල් වලින්ම භාවිතා කර ඇත. තට්ටු තුනකින් යුක්තව ලී වලින් සෑදූ සොල්දර සහිතව ඉදිකර ඇත. ලී පටි වලින් සාදා ඇති මහලවල්වල බීජ අතුරා ඒවා වේලා ගැනීම සඳහා තාප බලය යොදාගෙන ඇත. පහතම මහලේ ගල් අගුරු දැමූ තාප යන්ත්‍ර සූත්‍රත්, මහලවල් තුනටම තාපය ගමන් කිරීම සඳහා සාදා ඇති ඉංජිනේරු තාක්ෂණයක් දැකගත හැකිය.

මෙම යන්ත්‍ර ක්‍රියාත්මක කළ පසු නිපදවන තාපය දෙවන හා තෙවන මහල් වලට ගමන් කිරීම සඳහා නළ සහ කවුළු සාදා ඇත. වර්තමානයේ මේවා දක්නට ලැබේ. සොල්දොර මත එලා ඇති කොහු ගෝනි මත දමා ඇති කොකෝ, ගම්මිරිස්, කෝපි යන බීජ මෙම තාපය මගින් වේළා ගනී. වර්තමානයේ මෙම ගොඩනැගිලිවල බීජ වේලා නොගත්තාද බීජ වර්ග, උපකරණ, බෙහෙත් ද්‍රව්‍ය ගබඩා කිරීම සහා කාර්යාලය ප්‍රයෝ"ජනය සඳහා මෙම ගොඩනැගිලි ප්‍රයෝජනයට ගෙනඇත. තවද මෙම ගොඩනැගිල්ලෙහි වහල මත සංගුව යන නලාව ද දක්නට ලැබේ. මෙම නලාව මගින් සිදු කර තිබෙනුයේ කම්කරුවන්ගේ වැඩ ආරම්භ කිරීම, විවේක කාලය, වැඩ අවසන් කිරීම දැනුම් දීමටය. මෙය වර්තමානයේ අක්කර 140 ක් පුරා පැතිර තිබුණද අතීතයේ අක්කර 1200ක පැතිර ඇත. වර්තමානය වන විට මෙම ගොඩනැගිලිවල ඇති යන්ත්‍ර සූත්‍ර අතහැර දමා ඇති අතර නව යන්ත්‍ර සූත්‍ර භාවිතා කෙරේ. පැරැණි යන්ත්‍ර සූත්‍ර අතරේ දැනට වර්තමානයේ දැකගත හැකි වනුයේ තාප බලයෙන් බීජ වේලා ගන්නා යන්ත්‍ර සූත්‍ර වේ. මෙම යන්ත්‍රයට ගල් අගුරු දමා රත් කර ඒවායින් නිපදවන තාපයෙන් මහල් තුනටම ගමන් කිරීම සඳහා තාප නළ ඔස්සේ ගමන් කිරීමට පහසුවන පරිදි නළ සහ කවුළු සාදා ඇත. පොළොව මට්ටමින් පහළ ඉදිකර ඇති පහළම මහලයේ මෙම යන්ත්‍රය ගබඩා කර ඇත. මෙම යන්ත්‍රයෙහි R. Hornsby & SONSL , Protected by patents, Grantham & Stockport. England යනුවෙන් සඳහන් කර ඇත. මෙහි ඇති අනෙකුත් යන්ත්‍රයෙහි Commercial COLTD Ceylon යනුවෙන් සඳහන් කර ඇත. මෙම යන්ත්‍රය වල Machine number අද වන විට පැහැදිලිව දක්නට නොමැත. වර්තමානයේ මෙහි බීජ වගා කර බීජ ලබා ගෙන ඒවා හොඳින් වෙලා ගබඩා කර ලාංකාවේ සෑම ප්‍රදේශකටම බෙදාහැරීම සිදුකරනු ලැබේ.

### සමාලෝචනය

මෙම විස්තරාත්මක පරීක්ෂණය මගින් බ්‍රිතාන්‍ය සමයට අයත් වාස්තු විද්‍යාත්මක ලක්ෂණ මොනවාද, ඉංජිනේරුමය තාක්ෂණය යොදාගෙන ඇති ආකාරය සහ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට සිදු කර ඇති බලපෑම පිළිබඳ හඳුනාගත හැකිය.

### ආශ්‍රිත මූලාශ්‍රය

ගොඩගේ, එන්.එස්. (2024). කුණ්ඩසාල කෘෂිකාර්මික ගොවිපළ පිළිබඳව. ඩබ්.ජී.එස්.එන්.කේ. ජයවික්‍රම, 2024 පෙබරවාරි 18.